ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගම - 2022
---------------------------------------------------

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි සමාගමේ ("සමාගම") 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නාවූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතිය යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී .වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇතිබව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

| | අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 1 හි 32 ඡේදය අනුව අස්තිත්වයක් විසින් ප්‍රමිතයක් මගින් අවශ්‍ය කෙරෙන හෝ අවසර දී ඇති විටෙක හැර වත්කම් හා වගකීම් හිලව් නොකළ යුතු වුවත් විදේශ රැකියා සමාගමකින් අයවිය යුතු රු.2,547,728 ක ශේෂය ගෙවිය යුතු මුදල් ශේෂයෙන් අඩුකර මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි දක්වා තිබුණි. ඒ හේතුවෙන් ගෙවිය යුතු හා ලැබිය යුතු ශේෂයන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | අදාළ නිවැරදි කිරීම් සිදුකර 2023 ගිණුම් වර්ෂයේදී ඉදිරිපත් කරන බව. | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත වලට අනුකූලව වත්කම් හා වගකීම් නිවැරදිව දැක්වෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළ යුතුය. |
| (ආ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 12 ප්‍රකාරව සමාලෝචිත වර්ෂය වෙනුවෙන් විලම්භිත බදු ගණනය කර නොතිබුණු අතර 2017 වර්ෂයේ සිට පැවත එන රු.264,653 ක විලම්භිත බදු වත්කම් ශේෂය පමණක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ජංගම නොවන වත්කම් යටතේ පෙන්නුම් කර තිබුණි. | 2023 වර්ෂයේ සිට අදාළ විලම්භිත බදු ගණනය කිරීමට කටයුතු කරන බව. | විලම්භිත බදු වටිනාකම ගණනය කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 34 ඡේදය ප්‍රකාරව සමාගමට අයත් පිරිවැය රු.74,370,330 ක් වූ ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධයෙන් 2013 වර්ෂයෙන් පසු ප්‍රත්‍යාගණනයක් සිදුකර එවායේ සාධාරණ වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්කර නොතිබුණි. | | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ඈ) | ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 16 හි 51 ඡේදය ප්‍රකාරව සමාගම විසින් වාර්ෂික ක්ෂය ගණනය කිරීමේදී, එහි වත්කම් සම්බන්ධයෙන් අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීව කාලය සමාලෝචනය නොකිරීම හේතුවෙන් තවදුරටත් භාවිතයට ගනිමින් පැවති පිරිවැය රු.10,675,735 ක් වූ ලී බඩු හා සවිකිරීම් සහ කාර්යාල උපකරණ අයිතමයන් 323 ක ධාරණ අගයන් ශුන්‍ය අගයක් වී තිබුණි. එම ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ක්ෂය කර අවසන් වී ඇති එහෙත් තවමත් භාවිතා කරන දේපළ පිරියත හා උපකරණ හඳුනා ගැනීම සහ ප්‍රත්‍යාගණනය කලයුතු දේපළ හා උපකරණ හඳුනාගෙන ප්‍රත්‍යාගණනයක් සිදුකර ඒවායේ නිවැරදි වටිනාකම මැනීම සඳහා ස්වාධීන විගණන ආයතනයක් වෙත භාරදී ඇති බව. | |

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|

| | | | |
|---|---|---|---|
| (අ) | ලී බඩු, සවිකිරීම් සහ කාර්යාල උපකරණ යටතේ හඳුනා නොගත් ශේෂ ලෙස එකතුව රු.1,341,146 ක් දීර්ඝ කාලයක සිට මූල්‍ය ප්‍රකාශන තුළ දක්වා තිබුණි. | ආයතනය විසින් භාවිතා කරන සියලුම දේපළ පිරියත හා උපකරණ නිවැරදි ප්‍රත්‍යාගණනය කරන ලද වටිනාකම් සහිත වූ ස්ථාවර වත්කම් ලේඛනයක් පිළියෙල කිරීම මගින් වර්ෂය තුළදී නිවැරදි නොවන ලෙස ගණනය කරන ලද ක්ෂය ගණනය කිරීම ඉදිරියේදී නිවැරදි ලෙස ගණනය කිරීම කල හැකි බව. | හඳුනා නොගත් ශේෂයන් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | මූල්‍ය ප්‍රකාශන අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශයෙන් ලැබිය යුතු මුදල් ශේෂය රු.2,460,744 ක් ලෙස දක්වා තිබුණද, කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන අනුව එම වටිනාකම රු.3,019,704 ක් ලෙස දක්වා තිබීමෙන් රු.558,960 ක නොසැසඳීමක් විය. | ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උපලේඛන අනුව ශේෂය හා ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සියේ ලැබිය යුතු ශේෂය අතර වෙනස පරීක්ෂාකර බලා වෙනස නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනු ලබන බව. | නිවැරදි වටිනාකම මුදල් ප්‍රකාශනවල සටහන් කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | ආපදාවට ලක්වන විගමණිකයින් වෙත ගෙවීම් කිරීම සඳහා 2013 වසරේදී ලාභයෙන් වෙන් කරන ලද ප්‍රතිපාදනයෙන් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විට පැවති රු.1,858,941ක ශේෂය සංචිතයක් ලෙස දැක්වීම වෙනුවට ගෙවිය යුතු ශේෂයක් ලෙස දක්වා තිබුණි. | 2023 වර්ෂයේදී අදාළ මුදල් වෙන් කිරීමක් ලෙස දක්වා නිවැරදි කිරීම සිදුකර දැක්වීමට කටයුතු කරන බව. | මෙම ගිණුම්කරණ දෝෂය නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6** ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

**1.6.1** ලැබිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | ශ්‍රමිකයින් විදේශගත කරන ලද විදේශීය සමාගම් වලින් ලැබිය යුතු (invoice receivable) රු.4,719,320 ක ශේෂයක් පවතින අතර එම ශේෂය තුළ වර්ෂ 5ට වැඩි කාලයක් සිට පැවත එන රු.3,772,364 ක ශේෂයක් පැවතුණි. | මෙම මුදල් අයකර ගැනීම සඳහා ඇති ගැටලු පිළිබඳ විමසා ඇති අතර ඉදිරියේදී අදාළ මුදල් අයකර ගැනීමට කටයුතු කරනු ලබව බව. | මෙම මුදල් අයකර ගැනීමට කටයුතු කළ යුතුය. |
| (ආ) | සමාගම විසින් පුද්ගලික ආයතනයක් සමඟ ඇති කරගත් ගිවිසුමකට අනුව ආරම්භ කරන ලද ඉන්සිලැබ් ආයතනය පවත්වාගෙන යෑම සඳහා ගොඩනැගිල්ලක් කුළී පදනම මත ලබාගෙන ඒ සඳහා රු.600,000 ක අත්තිකාරම් මුදලක් ලබා දී තිබුණු අතර මේ වන විට ගොඩනැගිල්ලෙන් ඉවත් වී තිබුණ ද එම ගොඩනැගිල්ල සම්බන්ධයෙන් විභාග වෙමින් පවතින නඩු කටයුත්තක් හේතුවෙන් අයකර ගැනීමට නොහැකි වී තිබුණි. | දැනට නඩුවක් පවතින බැවින් රු.600,000ක අත්තිකාරම් මුදල නැවත අයකර ගැනීමට නොහැකි අතර, අදාළ නඩුව සඳහා ප්‍රතිපාදන ඉදිරි වර්ෂයේදී වෙන් කිරීමට කටයුතු කරන්නෙමු. | සමාගමට අවාසි සහගත නොවන පරිදි නඩු කටයුත්ත අවසන් කර ගැනීමට කළමනාකාරීත්වය කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | **2015** වර්ෂයට පෙර සිට පැවත එන ලැබිය යුතු එකතුව රු.**1,118,392**ක් වූ රඳවා ගැනීමේ බදු හා එකතුව රු.**1,340,623**ක් වූ එකතු කළ අගය මත බදු හා රු.**211,225** ක් වූ රක්ෂණ වාරිකය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | අදාල බදු ගෙවීම් නියමිත පරිදි සිදුකර ඇති අතර මෙය ගිණුම් තැබීමේදී සිදුවී ඇති දෝශයකි. **2023** වර්ෂයේදී නිවැරදි කරනු ලබන බව. රක්ෂණ මුදලද කාර්යාංශය දැනුවත් කර අයකර ගැනීමට කටයුතු කරනු ලබන බව. | ලැබිය යුතු ගිණුම් ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.2** ගෙවිය යුතු මුදල්

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **2013** වර්ෂයේ සිට **2019** වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාළව රැකියා සඳහා විදේශ ගතවී සිටියදී මිය ගිය ශ්‍රමිකයන්ට ගෙවිය යුතු එකතුව රු.**6,289,993** ක මරණ වන්දි **2023** ජූනි **31** දක්වාම නිදහස් කිරීමට කළමනාකරණය කටයුතු කර නොතිබුණි. | විදේශ රැකියා නියුක්ති කාර්යාංශය විසින් වන්දි මුදල් ගෙවීමට නියමිත නිර්දේශිත වන්දිලාභියාගේ නාම ලේඛන ලැබුණු විගස ගෙවීම සිදුකරනු ලබන බව. | ශ්‍රමිකයන් වෙනුවෙන් ලැබී ඇති මරණ වන්දි ගෙවා නිදහස් නොකිරීමට හේතු සොයා බලා කඩිනමින් නිදහස් කිරීමට පියවර ගත යුතුය. |
| (ආ) | **2022** දෙසැම්බර් **31** දිනට ගෙවිය යුතු ශේෂය රු.**82,242,065** ක් වූ අතර ඉන් රු.**43,662,769** ක් වර්ෂ **5** ත් වර්ෂ **15** ත් අතර කාලයක සිට පැවත එන ශේෂ විය. එම ශේෂ නිසි පරිදි හඳුනාගෙන මුදල් ගෙවීමට හෝ පොත් වලින් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | ගෙවිය යුතු පාර්ශ්වයන් හඳුනාගෙන මුදල් ගෙවීමට හෝ පොත්වලින් ඉවත් කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6.3** නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | **2018** ජූලි **17** දිනැති **2018** අංක **19** දරන ජාතික විගණන පනතේ<br>**i. 40(i)** වගන්තිය | මෙම පනත යටතේ විගණනය කරනු ලබන අස්තිත්වයෙහි අභ්‍යන්තර විගණනය සිදු කිරීම සඳහා එම අස්තිත්වයෙහි පාලක මණ්ඩලය විසින් යථා පරිදි පත්කරනු ලබන තමාගේම අභ්‍යන්තර විගණකවරයෙකු සිටිය යුතු වුවත් විදේශ රැකියා ඒජන්සි සමාගමේ ආරම්භයේ සිට මේ දක්වාම අභ්‍යන්තර විගණන ඒකකයක් පිහිටුවා නොතිබුණි. | මේ වසරේ සිට අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට අදාළ කටයුතු සිදු කරමින් පවතින බව. | ඵලදායී අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට කටයුතු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| ii. 41(2)(උ) වගන්තිය | අදාළ පාලන මණ්ඩලය විසින් තමාට සහයදීම පිණිස විගණන හා කළමණාකරණ කමිටුවක් පිහිටුවා නොතිබුණි. | අදහස් දක්වා නොමැත. | නිසි අභ්‍යන්තර පාලනයක් ඇති කිරීම පිණිස විගණන හා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතුය. |

**2.** මූල්‍ය සමාලෝචනය

**2.1** මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.37,691,612 ක ලාභයක් වූ අතර ඊට ප්‍රතිවිරුද්ධ ඉකුත් වර්ෂයේ අලාභය රු.15,326,918 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.53,018,530 කින් වර්ධනයක් නිරීක්ෂණය විය. විදේශගත කිරීම සඳහා ශ්‍රමිකයින් බඳවා ගැනීමේ ආදායම්, ගුවන් ප්‍රවේශ පත්‍ර නිකුත් කිරීමෙන් ලද ආදායම හා ස්ථාවර තැන්පතු පොළී ආදායම් වැඩි වීම මෙම වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**2.2** ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

(අ) 2021 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ විදේශගතවීම් සියයට 114කින් වර්ධනය වී තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ශ්‍රමිකයින් විදේශගත කිරීමෙන් ඉපයූ ආදායම රු.මිලියන 14.69කින් වර්ධනය වී තිබුණු අතර එය සමස්ථ ආදායමින් සියයට 23ක් වී තිබුණි.

(ආ) විදේශ රැකියා ඒජන්සි සමාගම මගින් ගුවන් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ලබන අතර, 2021 වර්ෂයට සාපේක්ෂව එමඟින් ඉපයූ ආදායම රු.මිලියන 52.2 කින් වර්ධනය වී තිබුණු අතර එය සමස්ථ ආදායමින් සියයට 63 ක් වී තිබුණි.

**3.** මෙහෙයුම් සමාලෝචනය

**3.1** කළමනාකරණ අකාර්යක්ෂමතා

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | රජයේ පූර්ණ හිමිකාරිත්වය ඇතිව ආරම්භ කර තිබූ මෙම සමාගම මගින් රජයේ සුරක්ෂිතතාවය මත සාපේක්ෂව අඩු පිරිවැයකින් සීමාවකින් තොරව ශ්‍රී ලාංකික ශ්‍රමිකයින් රැකියා සඳහා යොමු කිරීමේ හැකියාව තිබුණද, 2021 හා 2022 වර්ෂ වලදී පිළිවෙළින් 2561 ක හා 2860 ක රැකියා ඇබෑර්තු ලැබී තිබුණද රැකියා සඳහා විදේශගතවී තිබූ ප්‍රමාණය පිළිවෙලින් 155ක් හා 333 වී තිබුණි. එය ලැබුණු රැකියා ඇබෑර්තු වලින් සියයට 4 ක් හා සියයට 13 ක් වූයෙන් සමාගමේ ප්‍රධාන අරමුණ ඉටු කර ගැනීම සඳහා කටයුතු කර නොමැති බව නිරීක්ෂණය විය. | කොරෝනා ගෝලීය වසංගතය හා රටතුළ පැවති ආර්ථික අස්ථාවර තත්වය හේතුවෙන් 2021, 2022 යන වසර වල විදේශ රැකියා සඳහා පිටත්වයෑම අවම මට්ටමක පැවති අතර, 2022 වසරේ අවසන් කාර්තුවේ සිට එහි පැහැදිලි වර්ධනයක් අත්පත් කර ගෙන ඇති බව. | සමාගම පිහිටුවීමේ අරමුණු අනුව කටයුතු කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.1,905,932ක ප්‍රතිපාදන වෙන් කර තිබුණද රු.393,988ක් පමණක් වැය කර තිබුණි. ඒ අනුව විදේශ රැකියා සඳහා බඳවා ගැනීමේ ප්‍රවර්ධන කටයුතු ප්‍රමාණවත් පරිදි සිදුකර නොතිබුණි. | 2019 වසරේ සිට රටතුළ පැවති විවිධ වූ ආර්ථික බලපෑම් හේතුවෙන් ආයතනයද ආර්ථිකමය වශයෙන් යම්කිසි වූ ආර්ථික අස්ථාවර තත්වයකට මුහුණු දීමට සිදුවූ නිසා ව්‍යාපාර ප්‍රවර්ධන කටයුතු සඳහා විශාල ලෙස ආයෝජනය කිරීම අවම වූ බව. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුව කාර්යය ඉටු කිරීමට කටයුතු කළ යුතුය. |
| (ඇ) | 1996 සාංගමික සංස්ථාවලියේ 2017 සැප්තැම්බර් 28 දිනැති විශේෂ යෝජනා සම්මුතිය මගින් (special resolution) සමාගමේ ව්‍යාපාරික කටයුත්තක් වශයෙන් විගමණික ශ්‍රමිකයන්ගේ ගුවන් ටිකට්පත් නිකුත් කිරීම ඇතුළත් කර සමාගම විසින් ගුවන් ටිකට්පත් නිකුත් කිරීමේ ඒකකයක් පිහිටුවාගෙන තිබුණි. එහෙත් අනුමත කාර්ය මණ්ඩලය තුළ ඊට අදාල තනතුරු අනුමත කර ගැනීමට හෝ පුහුණු කාර්යය මණ්ඩලයක් පත්කර ගැනීම සිදුකර නොතිබූ අතර ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රය (IATA) නීත්‍යානුකූලව ලබා ගැනීමද සිදුකර නොතිබුණි. ඒ හේතුවෙන් නියෝජිත ආයතනය මගින් ගුවන් ටිකට්පත් නිකුත් කිරීමේ සේවාව ඉටු කිරීම නිසා විදේශගතවන ශ්‍රමිකයින්ට ගුවන් ටිකට්පත් මිලදී ගැනීම වෙනුවෙන් වැඩි මුදලක් ගෙවීමට සිදු වී තිබුණි. | ශ්‍රී ලංකා විදේශ රැකියා ඒජන්සි පුද්ගලික සමාගම සතුව ගුවන් ප්‍රවාහන සේවා බලපත්‍රය ලබා ගැනීම සඳහා IATA පුහුණු සහතිකය ලබා ගත් නිළධාරීන් නොසිටි බැවින් කාර්යාංශයේ කළමනාකාරීත්වය අනුමැතිය මත සහ මෙම නිලධාරීන්ගේ සහයෝගය මත අදාළ ගුවන් ටිකට්පත් ආයතනය 2021.01.26 දින ආරම්භ කරන ලද බව. 2023 වර්ෂය තුළ අප ආයතනය ලාභ ලබන තත්වයට පත් කර ගත් බැවින්ද ගුවන් ටිකට්පත් ලබා දීම වර්ධනය කරගත් බැවින්ද, ගුවන් ටිකට්පත් පුහුණු කරවීම හා IATA සහතිකය ලබා ගැනීම සඳහා නිලධාරියෙකු පුහුණු කිරීම ආරම්භ කරන ලද බව. | සමාගමේ ව්‍යාපාර කටයුතු සිදු කිරීම සඳහා අවශ්‍ය නීතිමය පසුබිම සකස් කරගත යුතුය. |
| (ඈ) | සමාගම සඳහා අනුමත බඳවා ගැනීමේ පරිපාටියට අනුව සමාගමේ සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බාහිර හෝ අභ්‍යන්තර මාර්ගවලින් අයදුම්පත් කැඳවා ස්ථිර පදනමින් නිලධාරියකු බඳවා ගැනීමකින් තොරව සමාගම ආරම්භයේ සිට මේ දක්වා වසර 26 තුල සාමාන්‍යාධිකාරීවරුන් 16 දෙනෙකු පත්කර තිබුණි. 2000 වසරෙන් පසු අවස්ථා 11 කදී කාර්යාංශ නිලධාරීන් 09 දෙනෙකු වැඩ බැලීමේ පදනම මත විධිමත් ක්‍රමවේදයකින් තොරව එහි සාමාන්‍යාධිකාරී ලෙස සේවයේ යොදවා තිබුණි. | සාමාන්‍යාධිකාරී තනතුර සඳහා වැටුප් හා අනෙකුත් දීමනා ලබාදීමට ආයතනයේ මූල්‍ය මට්ටම ශක්තිමත්වී නොතිබීම හා විදේශ සේවා නියුක්ති කාර්යාංශය යටතේ පරිපාලිත ආයතනයක් වන අප ආයතනය වෙත කාර්යාංශයෙන් ඒ සඳහා සුදුසුකම් හා පලපුරුදු ලත් නිලධාරීන් එහි ඉහළ කළමනාකාරීත්වය මගින් පත් කර එවා ඇති බව. | අනුමත බඳවා ගැනීමේ පටිපාටියට අනුව සුදුසුකම් ලත් කාර්යය මණ්ඩලයක් ස්ථිර පදනමින් බඳවා ගෙන සමාගමෙහි කටයුතු කාර්යක්ෂමව පවත්වාගෙන යාමට කටයුතු කළ යුතුය. |

**3.2** මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාගමේ සමාලෝචිත වර්ෂය සඳහා සකස්කළ ක්‍රියාකාරී සැලැස්මට අනුව ක්‍රම 05 ක් මගින් නව රැකියා ඇනවුම් 49ක් ලබා ගැනීමට රු.මිලියන 2.2ක් ඇස්තමේන්තු කර තිබුණද රු.මිලියන 1.2 ක් වැයකර රැකියා ඇණවුම් 22 ක් පමණක් ලබාගෙන තිබුණි. | සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මට අනුව ප්‍රගතිය ඉදිරිපත් කරන බව. | ක්‍රියාකාරී සැලැස්ම විධිමත් අයුරින් සංශෝධනය කර ඒ අනුව කටයුතු කළ යුතුය. |

**4.** ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

**4.1** මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2004 පෙබරවාරි 24 දිනැති අංක 01/2004 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන චක්‍රලේඛය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාගම විසින් දින 80ක් ප්‍රමාද වී 2023 මැයි 19 දින මූල්‍ය ප්‍රකාශන විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. | 2022 වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2023 ජනවාරි 30 දින වන විට අවසන් කලද මූල්‍ය ප්‍රකාශන ආකෘතියේ ආකෘතිමය වෙනස්කම් සිදු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් උපදෙස් දෙන ලදි. අදාළ ආකෘතිමය වෙනස්කම් සිදු කිරීමෙන් අනතුරුව නැවත අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර අදාළ අනුමැතිය ලබා ගැනීමෙන් අනතුරුව මූල්‍ය ප්‍රකාශන ලබා දීම සිදු කරන ලද බව. | මූල්‍ය ප්‍රකාශන නියමිත දිනට පෙර ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය. |